තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

## එච්.එල්.කරුණාසේන එ. ජාතික පොලිස් කොමිෂන් සභාව

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 540/2018 (2019.03.11) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.
.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - එච්.එල්.කරුණාසේන
**නොතිසි ලත් පාර්ශවය** - නම් කළ නිලධාරී, ජාතික පොලිස් කොමිෂන් සභාව

**පෙනීසිටීම**

අභියාචක - පැමිණ නැත.
පොදු අධිකාරිය - ඒ.යූ.එස්. මුණවීර- සහකාර ලේකම්
ඒ.එන්. දර්ශනී- කළමණාකරණ සහකාර
අයි.එම්.ජී.අයි. ගමගේ- විමර්ශන නිලධාරී

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.05.07 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාර දක්වා නොමැත. |
| නම් කල නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.06.04 |
| නම් කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාර දක්වා නොමැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.07.11 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

අභියාචක විසින් 2018.05.07 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.

රජයේ අත් අකුරු පරීක්ෂක වරයාගේ වාර්තාව සම්බන්ධයෙන් අධිකරණය දැනුවත් නොකිරීම පිලිබදව සිදු කර ඇති පැමිණිල්ල (කැබිතිගොල්ලාව මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක B/284/2001 නොහොත් අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක: B/1469/2001).එමනිසා මගේ පැමිණිල්ලට අදාළව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයට අනුව පහත සඳහන් තොරතුරු ,

I. කැබිතිගොල්ලෑව පොලීසිය විසින් ඉහත අංක දරණ බී වාර්තා නඩුව සඳහා සැකකරුවන් කීදෙනෙකු ඉදිරිපත් කර තිබුනේද? (ඔවුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න)

II. ඉහත අංක දරණ නඩුවේ සැකකරුවන් කීදෙනෙකුගේ අත්අකුරු ආදර්ශක පොලීසිය විසින් ලබාගෙන තිබුනේද? (ඔවුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න).

III. පොලිසිය විසින් ගරු අධිකරණයෙන් ලබා ගත් නියෝග මත 3වන සැකකරුගෙන් ලබාගත් අත් අකුරු ආදර්ශක රජයේ අත්අකුරු පරීක්ෂකවරයා වෙත යොමු කර තිබුනේද? නැද්ද?

IV. i. එසේ යොමු කර තිබුනේ නැත්නම් එයට හේතුව කරුණු සහිතව පැහැදිලි කරන්න.
ii. එසේ යොමුකර තිබුනේ නැත්නම් එය නීති විරෝධී ක්‍රියාවක් වන්නේද? නොවන්නේද?

V. i. 3වන සැකකරුගේ නම අධිකරණ නියෝගයකින් තොරව නඩු ලේඛනයෙන් ඉවත් කර තිබුනේද? නැද්ද?
ii. එසේ ඉවත්කර තිබුණුබව පිළිගන්නේ නම් එය නීති විරෝධී ක්‍රියාවක් වන්නේද? නොවන්නේද?
iii. පොලීසියට එවැනි නීති විරෝධී ක්‍රියාවක් සිදුකිරීමට හැකිද? නොහැකිද?
iv. නොහැකිනම් එම නීති විරෝධී ක්‍රියාව සිදු කළ හෝ එම නීති විරෝධී ක්රියාව සිදුකිරීමට ඉඩදී බලා සිටි අදාළ පොලිස් නිලධාරියාට හෝ නිලධාරීන්ට දඬුවම් ලබාදීමට කටයුතු කරන්නේද? නැද්ද?

VI. රජයේ අත්අකුරු පරීක්ෂකයා විසින් 1 සහ 2 සැකකරුවන් දෙදෙනාගේ අත්අකුරු පිලිබඳ වාර්තාව පොලිසිය වෙත යොමු කර තිබුනේද? නැද්ද?

VII. එම අත්අකුරු වාර්තාවෙන් 1වන සැකකරුගේ අත්අකුරු අපරාධයේ අත්අකුරු සමග සැසදෙන බව දන්වා එවා තිබුනේද? නැද්ද?

VIII. එම වාර්තාවෙන් 2වන සැකකරුගේ අත්අකුරු අපරාධයේ අත්අකුරු සමග සැසදෙන්නේ නැති බව දන්වා ඒවා තිබුනේද? නැද්ද?

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

IX. අත් අකුරු වාර්තාවක් පොලීසිය වෙත ලැබුණු පසු අදාළ පොලිසිය විසින් ඒ සම්බන්ධයෙන් ගරු අධිකරණය දැනුවත් කළ යුතුද? නැද්ද?

X. දැනුවත් කළ යුතු නැත්නම් අදාළ සැකකරුවන්ගෙන් අත්අකුරු ආදර්ශක ලබාගෙන ඇතතේ මොන හේතුවකටද? එම හේතුව කරුණු සහිතව පැහැදිළි කරන්න.

XI. එම වාර්තාව සම්බන්ධයෙන් ගරු අධිකරණය දැනුවත් නොකර අදාල පොලීසිය විසින් ගරු අධිකරණය වෙත ව්‍යාජ කරුණු ඇතුලත් බී වාර්තා ඉදිරිපත් කර ගරු අධිකරණය නොමග යවා යම් යම් වැරදි නියෝග ගරු අධිකරණයෙන් ලබාගෙන තිබෙන බව පිළිගන්නේද? නැද්ද?

XII. අදාළ පොලීසිය විසින් එසේ සිදු කර ඇත්නම් එය නීති විරෝධී ක්‍රියාවක් වශයෙන් පිළිගන්නේද? නැද්ද?

XIII. එසේ සිදු කර ඇත්නම් එම වරද නීතියෙන් දඩුවම් ලැබියයුතු වරදක් වන්නේද? නොවන්නේද?

XIV. අදාළ පොලීසිය විසින් එසේ සිදු කිරීම නිසා අත් අකුරු වාර්තාවෙන් එකී අපරාධය සිදු කර තිබුණු බවට තහවුරු වී සිටින 1වන සැක කරුට අදාල චෝදනාවෙන් දඩුවම් නොලබා නිදහස් වීමට හැකිවී තිබේ. එය පිළිගන්නේද? නැද්ද?

XV. පොලිසිය විසින් එසේ සිදුකර ඇති බව පිළිගන්නේ නම් එයට වගකිව යුතු පොලිස් නිලධාරියා හෝ නිලධරයන් සංවිධානාත්මක ලෙස එකතු වී අපරාධයක්(වරදක්) සිදුකර ඇතිබව පිළිගන්නේද? නැද්ද?

XVI. අදාළ පොලිසිය විසින් අත් අකුරු වාර්තාව ලද පසු ගරු අධිකරණය දැනුවත් කරන බවත් ඒ අනුව පැමිණිල්ල ඉදිරිපත් කරන බවත් ගරු අධිකරණය වෙත දැනුම් දී ඇති බව පිළිගන්නේද? නැද්ද?

XVII. එසේ දැනුම් දී තිබියදී එයට පටහැනිව කටයුතු කිරීමෙන් අදාල පොලිසිය විසින් ගරු අධිකරණයට අපහාස කිරීමක් සිදුකර ඇති බව පිළිගන්නේද? නැද්ද? එය නීතියෙන් දඩුවම් ලැබිය යුතු වරදක් වරදක් වන්නේද? නැද්ද?

XVIII. පිළිනොගන්නේ නම් කරුණු සහිතව පැහැදිලි කරන්න

XIX. අභියාචක විසින් ඉහත දක්වා ඇති කරුණු අනුව අදාල පොලීසිය විසින් ඉහත අංක දරණ නඩුව පවත්වාගෙන යාමේදී වරදවල් ගණනාවක් සිදු කර ඇති බව පෙනේ. ඒවා අතපසුවීමකින් සිදුවූ වැරදි නොවන බවත් කරුණු දැන දැනම සිදු කර ඇති වරදවල් බව

XX. ඒ අනුව ඊට වගකිවයුතු සියලු පොලිස් නිලධරයන් අපරාධ නීතිය යටතේ දඩුවම් ලැබිය යුතු ද ?නැද්ද ? දඩුවම් ලැබිය යුතු නැත්නම් ඒ බව කරුණු සහිතව පැහැදිලි කරන්න

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

XXI. අභියාචක විසින් ඉහත දක්වා ඇති කරුණු වලට අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අභියාචකගේ පැමිණිල්ලට අදාලව විධිමත් පරීක්ෂණයක් සිදුකර නැති බව පෙනේ. එය පිළිගන්නේද ? නැද්ද ?

XXII. පිළිනොගන්නේ නම් කරුණු සහිතව පැහැදිලි කරන්න

XXIII. තවද අභියාචක විසින් ඉල්ලා ඇති ඉහත සදහන් තොරතුරු සියල්ල අභියාචක වෙත ලබා නොදෙන්නේනම් ජාතික පොලිස් කොමිෂන් සභාවේ අදාල බලධාරීන් විසින් අභියාචකගේ පැමිණිල්ලට අදාලව ව්‍යාජ විමර්ශනයක් පවත්වා විශාල දූෂණ ක්‍රියාවක් සිදුකර ඇති බව විශ්වාස කරන බව

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.06.04 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.07.11 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

## අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:

මෙදින විභාගයට පොදු අධිකාරියෙන් සහකාර ලේකම්වරයාද, තොරතුරු නිලධාරියාද ඇතුළු තිදෙනෙක් සහභාගී වූහ. එහෙත් අභියාචක පැමිණ නැත. මේ වන විට තොරතුරු යවා ඇති බව පොදු අධිකාරිය පවසයි. ඒ අනුව විභාගය අවසන් කිරීමට නියෝග කෙරේ. ඒ බව අභියාචකට දන්වා මසක් ඇතුළත පිළිතුරු නොලැබුණහොත් ගොනුවේ කටයුතු නිම කරනු ඇත.

## නියෝගය:

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අභියාචක විසින් ඉල්ලුම් කොට ඇති තොරතුරු පොදු අධිකාරිය සතුව පවතින හෙයින්ද, 5(1) වගන්තියේ ව්‍යතිරේකයට යටත් නොවන හෙයින්ද, එම ඉල්ලීමට අදාළ තොරතුරු ලබා දී ඇති බැවින් අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.